## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

# පුරප්පාඩු

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල වෙත සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ (පූර්ණ කාලීන ස්ථීර / තාවකාලික පදනම මත)

**<u>පූර්ණ කාලීන - ස්ථීර පදනම මත</u>**

**1. <u>විශේෂඥ වෛද්‍ය නිලධාරි – කායික රෝග</u>**

**<u>සුදුසුකම්:</u>**

I. 2018 අංක 28 දරන වෛද්‍ය (සංශෝධන) පනතට අනුව ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි/ ලියාපදිංචි විය හැකි වෛද්‍ය නිලධාරියෙකු වීම.

හෝ

II. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය සහිත වෛද්‍ය නිලධාරියෙකු වීම.

සහ

III. කායික වෛද්‍ය විශේෂඥ (MD) උපාධිය සමඟ කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මාණ්ඩලික සහතිකය (Board Certification) ලබා තිබීම. (2014.10.11 දින නිකුත් කරන ලද 1883/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ I වන ඇමුණුම).

සහ

IV. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

**<u>වැටුප් පරිමාණය:</u>**

MC 1-2 රු.(91,645 - 12 × 2,700 - 124,045)
* විශේෂඥ වෛද්‍ය නිලධාරි MC 1-2 පියවර 01 හි තබනු ලැබේ. - රු. 91,645.00

**2. <u>වෛද්‍ය නිලධාරි - I ශ්‍රේණිය</u>**

**<u>සුදුසුකම්:</u>**

I. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

II. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති, පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන ආයතනවල II ශ්‍රේණිය වෛද්‍ය නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර හයක (06) පළපුරුද්ද ලබා තිබීම.

සහ

III. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 11.10.2014 දින නිකුත් කරන ලද 1883/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ II වන ඇමුණුම යටතේ පිළිගත් පශ්චාත් වෛද්‍ය උපාධියක් ලබා තිබීම.

සහ

IV. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

**<u>වයස් සීමාව:</u>**

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**<u>වැටුප් පරිමාණය:</u>**

MO 1-1 රු.(58,675 - 3 × 1,375 - 7 × 1,385 - 2 × 1,910 - 10 × 2,270 - 99,015)
*වෛද්‍ය නිලධාරි – I ශ්‍රේණිය MO 1-1 පියවර 14 හි තබනු ලැබේ රු.78,585.00 + අනුමත අනෙකුත් දීමනා.

**3. <u>වෛද්‍ය නිලධාරි - II ශ්‍රේණිය</u>**

**<u>සුදුසුකම්:</u>**

I. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

II. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන රෝහලක අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්ද ලබා තිබීම.

සහ

III. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද “Certificate of Good Standing” ලබා තිබීම.

**<u>වයස් සීමාව:</u>**

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**<u>වැටුප් පරිමාණය:</u>**

MO 1-1 රු.(58,675 - 3 × 1,375 - 7 × 1,385 - 2 × 1,910 - 10 × 2,270 - 99,015)
*වෛද්‍ය නිලධාරි – II ශ්‍රේණිය MO 1-1 පියවර 05 හි තබනු ලැබේ.රු.64,185.00 + අනුමත අනෙකුත් දීමනා.

**4. <u>වෛද්‍ය නිලධාරි - ප්‍රාථමික ශ්‍රේණිය</u>**

**<u>සුදුසුකම්:</u>**

I. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

II. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද “Certificate of Good Standing” ලබා තිබීම.

**<u>වයස් සීමාව:</u>**

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**<u>වැටුප් පරිමාණය:</u>**

MO 1-1 රු.(58,675 - 3 × 1,375 - 7 × 1,385 - 2 × 1,910 - 10 × 2,270 - 99,015)
* වෛද්‍ය නිලධාරි – ප්‍රාථමික ශ්‍රේණිය MO 1-1 පියවර 02 හි තබනු ලැබේ - රු. 60,050.00 + අනුමත අනෙකුත් දීමනා.

## පූර්ණ කාලීන - තාවකාලික පදනම මත

### 1. රියදුරු

**සුදුසුකම්:**

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම.

**ප්‍රවීණතා :**

I. මෝටර්රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කල බර වාහන පැදවීම සඳහා වූ පැරණි රියදුරු බලපත්‍රයට අනුව මෝටර්රථ පැදවීමේ “A” ශ්‍රේණියේ රියදුරු බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රයට අනුව මෝටර්රථ පැදවීමේ “D” ශ්‍රේණියේ රියදුරු බලපත්‍රයක් ලබා තිබීම.

**පළපුරුද්ද :**

I. රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් ලබා තිබීම.

**කායික සුදුසුකම් :**

I. තනතුරේ රාජකාරි ඉටු කිරිමටත් දිවා රාත්‍රී කාලයේ රාජකාරි සඳහා සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර අවශ්‍යතාවය මත පැය 24 ම සේවා මුර වලට රාජකාරි සඳහා සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර ප්‍රමාණවත් ශාරිරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

II. අවම උස අඩි 05 යි අඟල් 2 1/2 ක් විය යුතුය.

III. ඇස් පෙනීම සම්බන්ධයෙන් පහත සඳහන් උපමාන වල දක්වා ඇති යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(අ). බර වාහන රියදුරන් බඳවා ගැනීමේදී ඇස් පෙනීම සම්බන්ධව ලංකා අක්ෂි වෛද්‍ය සංගමය පිලිගත් නිර්ණායක වන වම් ඇස සහ දකුණු ඇස 6/9 සීමාව තුළ පැවතිය යුතුය.

(ආ). වර්ණ අන්ධතාවය පරික්ෂා කිරිමේදී ලංකා අක්ෂි වෛද්‍ය සංගමයේ නිර්දේශිත නිර්ණායකයන් අනුව වර්ණ අන්ධතාවය නොතිබිය යුතුය.

**වයස් සීමාව:**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

* රියදුරු PL 3 - රු.26,290.00 + අනුමත අනෙකුත් දීමනා.

**2. <u>බහුකාර්ය කම්කරු</u>**

**සුදුසුකම්:**

I. අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් ඇතුළුව විෂයන් හයක් සමත්වී තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

* බහුකාර්ය කම්කරු PL 1 - රු.24,750.00 + අනුමත අනෙකුත් දීමනා.

**පොදු කොන්දේසි:**

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

2. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල තුළ හෝ විශ්වවිද්‍යාල පරිපාලනය මගින් තීරණය කරනු ලබන ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක හෝ සේවය කිරීමටත් තනතුරේ රාජකාරි මැනවින් ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

3. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

4. අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනය වන විට අයදුම්කරුවන් සියලු සුදුසුකම් සම්පූර්ණ කොට තිබිය යුතුය.

5. විශේෂඥ වෛද්‍යවරුන් විශ්වවිද්‍යාලයේ වෛද්‍ය හා සම සෞඛ්‍ය විද්‍යා පීඨවල පීඨාධිපතිවරුන්ගේ සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මඟ පෙන්වීම යටතේ එම පීඨවල සිසුන්ගේ ඉගැන්වීම් කටයුතු වලටද දායක විය යුතුය.

6. විශේෂඥ වෛද්‍ය නිලධාරි සහ වෛද්‍ය නිලධාරි තනතුරු ස්ථිර වන අතර, රාජ්‍ය සේවයෙහි රැකියාවක නියුතුව සිටි නිලධාරින් වසර එකක (01) පරිවාස කාලයකට යටත් වේ.

7. සේවක අර්ථසාධක අරමුදල සඳහා ඔබගෙන් 10% දායකත්වයක්ද විශ්වවිද්‍යාලය වෙතින් 15% දායකත්වයක්ද දරන අතර සේවක භාරකාර අරමුදල සඳහා විශ්වවිද්‍යාලය වෙතින් 3% දායකත්වයක් දරනු ලැබේ. (පාර්ලිමේන්තුව විසින් නීතියෙන් නියම කරනු ලැබිය හැකි සංශෝධන වලට යටත්ව)

8. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමඟින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතික වල ඡායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් **2024.09.23** දිනට හෝ ඊට පෙර "විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වේරහැර" යන ලිපිනයට යොමු කළ යුතු අතර, ලියුම්කවරයේ ඉහළ වම් කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

9. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සතුවේ.

10. අසම්පූර්ණ සහ/හෝ ප්‍රමාද වී යොමු කරනු ලබන නියමිත ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. මෙම කාර්ය මණ්ඩලය විශ්වවිද්‍යාල රෝහල වෙත බඳවා ගනු ලබන අතර විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් නොවේ.

12. අයදුම්පත්‍ර භාගත කර ගැනීමට සහ වැඩි විස්තර සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසෙන්න. www.kdu.ac.lk / දුරකථන අංකය – 0112044555.

**www.kdu.ac.lk**